# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,009 - 2017 මාර්තු මස 03 වැනි සිකුරාදා - 2017.03.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 574 |

| | පිටුව |
|---|---|
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 574 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - (i) හෙක්ටර් අප්පුහාමි හෙල්පිත් හැන්ඩ් පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 පෙබරවාරි මස 17 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ශාන්ත අබේසේකර සංවර්ධන, සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 පෙබරවාරි මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2017 මාර්තු මස 24 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 මාර්තු මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

**1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනත සමග කියැවෙන 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධනය වූ 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 2 (2) උපවගන්තිය යටතේ විශේෂ ආඥාවක් අනුව සිදු කරන බලය පැවරීම**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනත සමග කියැවෙන 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධනය වූ 1972 අංක 05 දරන සමුපකාර සමිති පනත යටතේ නියෝගය.

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනත සමග කියැවෙන 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධිත 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 2 (2) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව වයඹ පළාත් සභාවේ පළාත් මාර්ග ප්‍රවාහන, සමුපකාර, වෙළෙඳ, නිවාස, ඉදිකිරීම් කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන අමාත්‍ය ආර්. පී. ඩී. ගුණදස දෙහිගම වන මම වයඹ පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ රෙජිස්ට්‍රාර්ට සහාය වීමට පත්කර ඇත්තා වූ මීට අමුණා ඇති උපලේඛනයේ I වැනි තීරුවෙහි සඳහන් අයට 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධිත වූ 1972 අංක 05 දරන සමුපකාර සමිති පනත හා ඒ යටතේ පනවා ඇති රීති මාලාව යටතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් වෙත පැවරී ඇත්තා වූ එකී උපලේඛනයේ III තීරුවෙහි සඳහන් සියලුම බලතල එකී උපලේඛනයේ II වැනි තීරුවෙහි සඳහන් දින සිට මෙයින් පවරමි.

ආර්. පී. ඩී. ගුණදස දෙහිගම,
වයඹ පළාත් සභාවේ පළාත් මාර්ග
ප්‍රවාහන, සමුපකාර, වෙළෙඳ, නිවාස,
ඉදිකිරීම් කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන
අමාත්‍ය.

2017 ජනවාරි මස 19 වැනි දින,
කුරුණෑගල දී ය.

**උපලේඛනය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| හේමචන්ද්‍ර පතිරණලාගේ ගුණපාල අජිත් කුමාර | 2017.01.02 | සමුපකාර සමිති පනතේ 3, 5, 6, 7, 8, 9, 33, 39, 44, 44(6), 45, 46, 48, 49, 50, 52, 53, 54, 58 [58(3) සහ 58(5) හැර] 59, 68 සහ 72 යන වගන්ති යටතේ කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයාගේ සියලු බලතල රීති මාලාවේ 4, 11, 15, 16, (II) 18, 19, 27, 32, 33, 35, 37, 39, 40, 41, 42, 43, 48, 49 [49(XII) හැර] 51, 52 සහ 53 දරන රීති යටතේ කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයාගේ සියලු බලතල. |

03-178

---

# තනතුරු - ඇබෑර්තු

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ කුරුණෑගල මහ නගර සභාවේ නීති නිලධාරි තනතුර සඳහා (විවෘත) බඳවා ගැනීම - 2017

01. වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ කුරුණෑගල මහ නගර සභාවේ විධායක සේවා ගණයෙහි නීති නිලධාරි III ශ්‍රේණියේ තනතුරෙහි පවතින පුරප්පාඩුව සඳහා බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම්ලත් වයඹ පළාතේ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *වැටුප් ක්‍රමය.-* 2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය SL1-2016 අනුව

රු. 47,615 - 10 x 1,335 - 8 x 1,630 - 17 x 2,170 - රු. 1,10,895 වේ.
නමුත් 2020.01.01 දක්වා ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.
(එය 2017.01.01 දින සිට මූලික වැටුප - රු. 32,807 + ගැලපුම් දීමනාව රු. 4,715 පරිදි වේ.)

03. *(අ) අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සුදුසුකම් :-*

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබූ විශ්වවිද්‍යාලයකින් නීතිය පිළිබඳ උපාධියක් ලබා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම හෝ නීති විද්‍යාලයේ අවසන් වසර විභාගය සමත්ව ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

*(ආ) පළපුරුද්ද :*

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් වසර 03කට නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම (මෙය අවම වශයෙන් අධිකරණයේ වසර 15ක් සක්‍රීය සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨ නීතිඥයෙකුගෙන් ලබාගත් සහතිකයක් මගින් සනාථ කළ යුතු වේ).

*(ඇ) කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකුම වයඹ පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

*(ඈ) වෙනත් සුදුසුකම් :*

(i) පූර්වාසන්න වසර පහක (05) කාලය තුළ වයඹ පළාත් සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
(ii) අයදුම්කරුවන් යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.
(iii) බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම්, 2017.04.03 දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර සහතික ලබා තිබිය යුතු ය.
(iv) 2017.04.03 දිනට වයස් සීමාව අවුරුදු 25ට නොඅඩු හා 35ට නොවැඩි විය යුතු ය.

04. *සේවා කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර ය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු ය.

(ii) මෙම තනතුරට පත් කරනු ලබන්නන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර ඔහු/ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරි වැඩ සහ හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබේ නම් හා අනෙකුත් සේවය ස්ථිර කිරීම සඳහා වන අවශ්‍යතාවයන් සම්පූර්ණ කර තිබේ නම් පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කරනු ලැබේ.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට ආනුශාංගික චක්‍රලේඛ අනුව සේවයට බැදී වසර 05ක් ඇතුළත සේවයට බැඳුණු භාෂා මාධ්‍යයට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව/භාෂා පිළිබඳ ප්‍රවීනතාව ලබාගත යුතු ය.

(iv) මෙම තනතුර සඳහා වූ බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මුදල් රෙගුලාසිවලට ද, වයඹ පළාත් මුල්‍ය රීති සංග්‍රහය, වයඹ පළාත් විනය කාර්ය සංග්‍රහය, වයඹ පළාත් සභා කාර්ය පරිපාටික රීති, දෙපාර්තමේන්තු නියෝග හා රජය හා වයඹ පළාත් සභාව විසින් පනවනු ලබන වෙනත් විධිවිධානවලට යටත් විය යුතු ය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* -

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අය සඳහා වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලබන අතර, මෙහි දැක්වෙන ලකුණු දීමේ පරිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා මුළු ලකුණු එකතුවේ කුසලතාව මත පුරප්පාඩුව සඳහා බඳවා ගැනේ.

06. *ලිඛිත විභාගය*.- අදාළ නොවේ.

07. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය*.- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ම සුදුසුකම් ද පරීක්ෂා කරනු ලැබේ.
ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

| *ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| **අතිරේක අධ්‍යාපන සුදුසුකම් :**<br><br>● පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලද නීතිය පිළිබඳ උපාධිය :<br><br>- පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා ලකුණු - 20<br>- දෙවන පන්තියේ ඉහල සාමාර්ථයක් සඳහා ලකුණු - 20<br>- දෙවන පන්තියේ පහල සාමාර්ථයක් සඳහා ලකුණු - 10<br><br>නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා - ලකුණු 15<br>නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා - ලකුණු 10<br><br>*සටහන*.- ගෞරව සාමාර්ථයක් සමග අවසන් විභාගය සමත් වුවහොත් පමණක් ලකුණු 10 ක් ලබාදිය යුතු ය.<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදේ.<br>උපාධිය හෝ නීති විද්‍යාල සුදුසුකම් වලින් එකක් සඳහා පමණක්) | **20** |
| **අතිරේක වෘත්තීය සුදුසුකම් :**<br><br>● පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදළ ක්ෂේත්‍රය පිළිබඳ අවුරුද්දකට නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් නීති ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින්)<br><br>● පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 06කට/පැය 720කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (එක් ඩිප්ලෝමාවකට ලකුණු 03 බැගින්.)<br><br>● පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 03කට/පැය 360කට නොඅඩු සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා (එක් පාඨමාලාවකට ලකුණු 02 බැගින්) | **15** |
| **අතිරේක පළපුරුද්ද :**<br><br>නීතිඥවරයෙකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පුද්ගලික අංශයේ පළපුරුද්ද<br><br>- මාස 06කට වැඩි හා අවුරුද්දකට අඩු ලකුණු 02<br>- එක් වසරකට ලකුණු 05 බැගින් උපරිම ලකුණු 30 (මූලික සුදුසුකම ලබා ගැනීම සඳහා අවශ්‍යවන නීතිඥයෙකු ලෙස කටයුතු කල වසර 03ක සේවා කාලය හැර)<br><br>- (අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයෙකුගේ හෝ විනිසුරුවරයෙකුගෙන් ලබාගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතු ය.) | **30** |

| *ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| **පරිගනක සාක්ෂරතාවය :**<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්ව විද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හදරා තිබීම සඳහා (ලකුණු 15)<br>රජයේ පිළිගත් ආයතනයක අවුරුදු 01කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා හෝ පැය 1500 සඳහා ලකුණු 10<br><br>රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා<br>- මාස 06/පැය 720 - ලකුණු 07<br>- මාස 03/පැය 360 - ලකුණු 05 | **15** |
| **ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය :**<br><br>ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය/උපාධිය/පශ්චාත් නීතිවේදී උපාධිය - ලකුණු 15<br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (වසර 01 හෝ පැය 1500) - ලකුණු 10<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා<br>මාස 06/පැය 720 - ලකුණු 07<br>මාස 03/පැය 360 - ලකුණු 05 | **15** |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 05 |
| **මුළු ලකුණු** | **100** |

*සටහන*.- (i) සමත් ලකුණු ප්‍රමාණය ඉහත ලකුණු එකතුවෙන් 60% ක් විය යුතු ය.
(ii) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ඉහලම ලකුණු ලැබූ අයදුම්කරු පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ.

08. *ඉල්ලුම් කළයුතු පිළිවෙල*.-

8.1 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කරගත යුතු ය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2017.04.03 වැනි දින හෝ එදිනට ප්‍රථම ''ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි ''වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ නීති නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම'' යනුවෙන් සඳහන් කල යුතු ය.

8.2 දැනටමත් රාජ්‍ය/පළාත් සභා රාජ්‍ය ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය.

8.3 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, ප්‍රමාද වී ලැබෙන, අපැහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තව ද සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න පිළිබඳව විමසා බැලීම අයදුම්කරු සතු වගකීමකි. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරු විසින්ම දරා ගත යුතු ය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

09. මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරා නොමැති අයගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල ලිපි ලේඛනවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය. සෑම අයදුම්කරුවෙක්ම තනතුරට අදල සියළු සුදුසුකම් 2017.04.03 දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

10. යම් අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව පත්වීම් ලැබීමට පෙර ඕනෑම අවස්ථාවක අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත. පත්වීම් ලැබීමෙන් පසු හෝ දූන දූනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑ කමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

11. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදල කරුණු හෝ එම නිවේදනයේ අනාවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධයෙන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

12. වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

පද්මිණී කාරියවසම්,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා
කොමිෂන් සභාව.

2017 ජනවාරි මස 14 වැනි දින,
පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව (වයඹ),
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ කුරුණෑගල මහ නගර සභාවේ නීති නිලධාරී තනතුර සඳහා (විවෘත) බඳවා ගැනීම - 2017***

විභාග අංකය : [ ]

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

01. 1.1 මුලකුරු සමඟ නම (සිංහලෙන්/දෙමළෙන්) :..........................................................

1.2 මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................................

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :..........................................................

1.4 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................................

1.5 ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

02. 2.1 ස්ථිර ලිපිනය :..........................................................

2.2 දුරකථන අංකය : පෞද්ගලික :.......................................... රාජකාරි :..........................................

03. ස්ත්‍රී/පුරුෂ භාවය (අදාල කොටුව තුළ "✓" ලකුණ යොදන්න.)

ස්ත්‍රී : [ ] පුරුෂ : [ ]

04. උපන් දිනය : වර්ෂය :.................. මාසය :.................. දිනය :..................

05. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස :

අවුරුදු :..................... මාස :........................... දින :.........................

06. 2017.04.03 වැනි දිනට වයඹ පළාතේ ස්ථිර පදිංචිය :

අවුරුදු :..................... මාස :........................... දින :........................

07. අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සුදුසුකම් :..........................................................................................

08. පළපුරුද්ද :...........................................................................................................................

09. අතිරේක අධ්‍යාපන සුදුසුකම් :.................................................................................................

10. අතිරේක වෘත්තීය සුදුසුකම් :..................................................................................................

11. අතිරේක පළපුරුද්ද :..............................................................................................................

12. පරිගණක සාක්ෂරතාවය :......................................................................................................

13. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය :......................................................................................................

14. අයදුම්කරුගේ සහතිකය :

..............................................................................වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

දිනය :........................ ...................................................,

අයදුම්කරුගේ අත්සන.

*අයදුම්කරුගේ අත්සන සහතික කිරීම*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ......................................................................................... මයා/මිය/මෙනවිය, මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය .................................. දින මා ඉදිරිපිට දී ඔහු/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

සහතික කරන අයගේ නම :.....................................................................................
අත්සන :...................................................................................................................
තනතුර හා නිති මුද්‍රාව :............................................................................................

(මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්වයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 240,360/-කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන, ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.)

*රජයේ හෝ පළාත් සභා රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය*

(අනවශ්‍ය වචන කපා හරින්න.)

.......................................................................................................................................... මයා/මිය/මෙනෙවිය දැනට.....................................................අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ........................................... වශයෙන් ස්ථිර සේවයේ යෙදී සිටින බවත්, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බවත්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගන්වා ඇති/නැති බවත්, තනතුර අතහැර ගිය අයෙකු සේ සලකා ඇති/නැති බවත් සහතික කරන අතර, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහු/ඇය තෝරාගනු ලබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරින් නිදහස් කළ හැකි ය/නොහැකිය.

දිනය :......................................................... ...................................................................,

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න.)

03-104

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | *රු.* | *ශ.* |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** *රු. ශ.* | **තැපැල් ගාස්තුව** *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සැහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2017** | | | |
| **මාර්තු** | 2017.03.03 | සිකුරාදා | 2017.02.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.03.10 | සිකුරාදා | 2017.02.23 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2017.03.17 | සිකුරාදා | 2017.03.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.03.24 | සිකුරාදා | 2017.03.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.03.31 | සිකුරාදා | 2017.03.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අප්‍රේල්** | 2017.04.07 | සිකුරාදා | 2016.03.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.04.12 | බදාදා | 2016.03.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.04.21 | සිකුරාදා | 2017.04.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.04.28 | සිකුරාදා | 2017.04.12 | බදාදා | දහවල් | 12.00 |
| **මැයි** | 2017.05.05 | සිකුරාදා | 2017.04.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.05.12 | සිකුරාදා | 2017.04.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.05.19 | සිකුරාදා | 2017.05.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.05.26 | සිකුරාදා | 2017.05.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.).*

2017 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.